# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2105/36 - 2019 ජනවාරි මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2019.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ බණ්ඩාරවෙල මහ නගර සභාවේ නගරාධිපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

මියයාම හේතුකොට ගෙන බණ්ඩාරවෙල මහ නගර සභාවේ නගරාධිපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වන වගන්තිය යටතේ තනතුර දැරූ නගරාධිපති වන නලීන් ප්‍රියන්ත සූරියගේ අයත්වන්නා වූ ස්වාධීන කණ්ඩායම් නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත නගරාධිපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු වූද, එම ස්වාධීන කණ්ඩායමට අයත්වන්නාවූ ද, එම බණ්ඩාරවෙල මහ නගර සභාවේ නගරාධිපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ජනක නිශාන්ත රත්නායක නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

බණ්ඩාරවෙල මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි එච්. අයි. ආර්. හතුරුසිංහ වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66ආ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ජනක නිශාන්ත රත්නායක, බණ්ඩාරවෙල මහ නගර සභාවේ නගරාධිපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එච්. අයි. ආර්. හතුරුසිංහ,
තේරීම්භාර නිලධාරි,
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2019 ජනවාරි මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

01 - 634

1A - G 29219 — 27 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*